**කැකිරාව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කැකිරාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**
**----------------------**

**(අ)** සමාලෝචිත වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලබාදී තිබුණු රු.717,428 ක් වටිනා ගැල්වනයිස් බට 648 ක් වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.224,310 ක්වූ පුස්තකාල පොත් වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ ලද අරමුදලින් සිදුකළ ව්‍යාපෘති යටතේ ගෙවිය යුතුව තිබුණු රු.328,028 ක මුදලක් පොදු සැපයුම් ණය හිමියන් යටතේ සහ සභා අරමුදල් ණය හිමියන් යටතේ දෙවරක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ණය හිමියෝ සහ ඌණතාවයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.9,712,359 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.4,080,023 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු.3,174,272 ක්වූ හිඟහිටි ආදායම් තුල දිර්ඝ කාලයක සිට පවතින හිඟ ශේෂද පැවති අතර මෙම හිඟ අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂය | **හිඟ මුදල** |
|---|---|
| | රු. |
| වරිපනම් | 1,955,917 |
| ටෙන්ඩර් මත කුලී (මස්කඩ මාළුකඩ ගාස්තු) | 532,065 |
| විනෝද බදු | 572,988 |
| වෙළඳ සැල් හා කඩ | 113,302 |
| | 3,174,272 |

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**(අ)** කැකිරාව දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රාදේශීය සභාව වෙනුවෙන් අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාල රු.17,055,210 ක් හා ඉකුත් වර්ෂයන්ට අදාල රු.33,183,448 ක උසාවි දඩ මුදල් මේ දක්වා සභාවට අයවී නොතිබුණි.

**(ආ)** 2012,2013 හා 2014 වර්ෂයන්ට අදාලව සභාව වෙත අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි .

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

**3.1 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**
-----------------------------------------------

**(අ)** රු.42,439,566 ක්වූ කර්මාන්ත ණයගැති ශේෂය තුල වර්ෂ 1-5 ක් අතර කාලයක සිට අයවිය යුතුව පවතින රු.1,255,333 ක ශේෂය අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** කර්මාන්ත ණයහිමි ශේෂය තුල වර්ෂ 1-5 අතර කාලයක සිට ගෙවිය යුතුව පවතින රු.2,126,546 ක ශේෂයක් විය. එම ශේෂය තුල කර්මාන්ත අතරුදවුම් මුදල් ලෙස හඳුනාගත හැකි ශේෂද පැවතුණි. මෙම ණයහිමි ශේෂ නිරවුල් කිරීමට හා අතරුදවුම් මුදල් ගෙවා නිදහස් කිරිමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ආ)** ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂයේ ජුලි හා අගෝස්තු මාසවලට අදාලව සභාව වෙත ලැබුණු රු.2,000,000 ක වටිනාකමට අදාල අනුමත ව්‍යාපෘති දෙසැම්බර් 31 දිනට අවසන් කිරිමට සභාව අපොහොසත් වීම හේතුවෙන් එම මුදලින් රු.1,143,489 ක මුදලක් 2015 වර්ෂයේදී ආපසු ගෙවා තිබුණි.

**3.2 ආර්ථික නොවන ගණුදෙනු**
-------------------------------------

සමාලෝචිත වර්ෂයේදී විදුලි උපාංග මිලදී ගැනීම සඳහා රු.322,575 ක් ගෙවා තිබුණි. එම උපකරණවල වර්තමාන මිලගණන් පදනම්ව ගණනය කළ විට රු.80,425 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.3 නිෂ්ක්‍රිය/ඌණ උපයෝජිත වත්කම්**
--------------------------------------

සභාව සතු එකතුව රු.2,690,329 ක් වටිනා වත්කම් සමාලෝචිත වර්ෂය තුලදී භාවිතයට නොගැනීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි.

**4. පද්ධති හා පාලනය**
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය